# දාබිඳු

පුවත්පතක් වශයෙන් ලියාපදිංචි කර ඇත

ආරම්භය 1984

40 වන කාණ්ඩය | 05 වන කලාපය | 2024 මැයි කලාපය


# අයිතිවාසිකම් දිනා ගැනීමේ වැඩ කරන කාන්තාවන්ගේ මැයි දිනය 2024!



මැයි දිනයේ පදනම තුළ, පැය 8ක වැඩ කරන දිනයක් සඳහා ජීවන වැටුපක හදිසි අවශ්‍යතාවය මතු කළ ද යථාර්ථය නම් කම්කරුවන්ට පැය 8කින් ජීවන වැටුපක් උපයා ගැනීමට නොහැකි වන අතර දීර්ඝ වැඩ දින සාමාන්‍යකරණය කිරීම අරමුණින් නව කම්කරු නීති සැලසුම් කරයි. ජීවන වැටුප් නොමැතිකම සහ ජීවන වියදම ඉහළ යාම නිසා වැඩිපුර උපයා ගැනීමට කර්මාන්තශාලාවල Manpower වැඩ, සංක්‍රමණික රැකියා සහ ලිංගික ශ්‍රමිකත්වය ඇතුළු අවිධිමත් වැඩ සඳහා කාන්තාවන් තල්ලු කර ඇත. සම්මුතීන් ඇත, අයිතීන් නැත! යන තේමාව යටතේ අයිතිවාසිකම් දිනා ගැනීමේ වැඩ කරන කාන්තාවන්ගේ මැයි දිනය 2024 මැයි මස 01 වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී කාන්තා නායකත්ව කේවල් කිරීමේ කමිටුව (WLBC) විසින් සංවිධානය කරන්නේ මේ සන්දර්භය තුළයි. 500 සහභාගිවන්නන්ගෙන් යුත් මෙම මැයි දිනය නිමි

2 වන පිටුවට...

## ඇතුළු පිටු


03 - 04 පිටුව - සම්මුතීන් ඇත, අයිතීන් නැත!
5 - 08 පිටුව - අපේ වැඩ
09 පිටුව - රානා ප්ලාසා කඩාවැටීම පිළිබඳව සිහිපත් කිරීමයි
10 පිටුව - සිතුවිල්ල / සිනහවේ කඳුළු කතාව
11 පිටුව - කවි පිටුව / ප්‍රහේලිකාව


නිදහස් වෙළඳ කලාපයේ ඉපැරණිම පුවත්පත

## ඩාබිඳු සාමූහිකය

221, වෙළඹඩ පාර, කටුනායක
දුර : 011 4 851 383
ඊ. මේල් : dabindu.infoco@gmail.com
Facebook : dabindu collective sri lanka
Web : www.dabinducollective


# අසාර්ථක පාලන ක්‍රමයන් හමුවේ සැමරූ ජාත්‍යන්තර කම්කරු දිනය

මෙවර ජාත්‍යන්තර කම්කරු දිනය අප සමරනු ලැබුවේ කම්කරුවන් ලෙස අසාර්ථක පාලන ක්‍රමයක් හමුවේ ණය බරින්, බදු බරින් හා සියළු පරාජයන් හමුවේ එයට කම්කරුවන්ගේ  සොච්චම් වැටුප පවා කප්පාදු කරන අවස්ථාවකය. රටේ බංකොලොත්භාවය හමුවේ වංචාව, දූෂණය හමුවේ ආර්ථික අර්බුදයට පිළියම් ලෙස ණය වල වගකීම රටේ පහළම කොටසින් අයකර ගැනීමට කටයුතු කිරීමේ පිළිකුල් සහගත සැලසුම් හමුවේ කම්කරුවා වල පල්ලට ඇඳ දමා ඇත. කලට මැතිවරණ නොපැවැත්වීම, ජාත්‍යන්තර ණය හිමියන්ට ගැති වීමත් එම නිසා රාජ්‍ය දේපල විකිණීමට, ණය ප්‍රතිව්‍යුහ ගත කිරීමේ මුවාවෙන් කම්කරුවන්ගේ අර්ථ සාධක මුදල් කොල්ලකෑම, කාන්තා ශ්‍රම බලකායට පහසුකම් සපයන මුවාවෙන් කම්කරු නීතී ප්‍රතිසංස්කරණ කිරීමට උත්සාහ දැරීම, කම්කරුවන් වහල් භාවයට ශ්‍රම සූරා කෑමට තව දුරටත් පිඹුරුපත් සකස් කර ගැනීම වැනි කොල්ලකාරී පසුබිමක් තුළ ජයග්‍රහණයන් සැමරීමේ දිනය අභියෝගයට ලක් විය. මෙවැනි පසුබිමක කම්කරුවන් වැඩි වශයෙන් සාමූහික විය යුතු බව අවධානයට ලක් විය යුතුය.

වාර්ෂික වැටුප් වැඩි වීම්, ප්‍රසාද දීමනා හා වැඩ පැය, සුබ සාධන පහසුකම් නිසි පරිදි නොගෙවන නිසා සෞඛ්‍ය පෝෂණය දරුවන්ගේ අධ්‍යාපනය සඳහා වෙන් කිරීමට නොහැකිව අද කම්කරු කාන්තාවන්ට තමන්ගේ ප්‍රධාන ආහාර වේල පවා කැප කිරීමට සිදු වී ඇත. රැකියාවේ අනාරක්ෂිතබව හමුවේ වෘත්තීය අයිතීන් වෙනුවෙන් හඬ නැගීමට කම්කරුවාට ඇති අයිතිය පාගා දමා ඇත. හඳුන්වා දීමට යෝජිත කම්කරු නීතී හමුවේ වැඩ කරන පන්තියේ රැකියා අවිධිමත් අංශය වෙත තල්ලු කරන ඒවා වේ. කර්මාන්තශාලා වසා දැමීම, කම්කරු නීතී පිළිබඳ තීරණ ගැනීමේ බලය හාම්පුතා වෙත පමණක් පැවරීමේ වහල් කම්කරු නීතී හකුලා ගැනීමට බල කෙරෙන කම්කරු දිනය සැමරීමට කටයුතු කරන වහල් පලකයින්ට අපගේ ශක්තිය පෙන්වමින් විරෝධතාවය පළ කළ යුතුය. ඒ යුක්ති සහගත හා සාධාරණ හඬ නැගීමට කම්කරු පන්තියේ බලය පෙන්වීමට සෑම දෙනාම ඒකරාශී විය යුතුය. අත්වැල් බැඳගත යුතුය.

1 පිටුවෙන්... **අයිතිවාසිකම් දිනා**

භාණ්ඩ ඇඟළුම් හා රෙදිපිළි සේවක සංගමය (TGCWU), වාණිජ හා කාර්මික සේවක සංගමය (CIWU), ඩාබිඳු සාමූහික සංගමය, RED සංගමය, Voice of Plantation People (VOPP) සහ Standup Movement Lanka (SUML) සාමාජිකයන්ගෙන් සමන්විත වැඩ කරන කාන්තාවන්ගේ සැමරුමකි. ඩාබිඳු සාමූහික සංගමයේ චමිලා තුෂාරි, CIWUහි ස්වස්තිකා අරුලිංගම්, RED සංගමයේ චන්ද්‍රා දේවනාරායන, VOPPහි ලවිනා හසන්ති, SUMLහි අශිලා දන්දෙණිය සහ TGCWUහි ලලිතා දෙද්දුවකුමාර යන වෘත්තීය සමිති ප්‍රධානීන්ගේ/ නියෝජිතයින්ගේ කතා මෙම උත්සවය වර්ණවත් කළේය.

එහිදී ඩාබිඳු සාමූහික සංගමයේ චමිලා තුෂාරි පැවසූ පරිදි "අපි අතිබහුතර කාන්තාවෝ වුණාට, අපි ගෙදර බලාගෙන, ළමයි බලාගෙන, ලෙඩ්ඩු බලාගෙන, වැඩත් සමඟ ඒ වැඩ ඒකාබද්ධ කරන්නේ කාන්තාවෝ!... මේ වගේ අවදානම් තැනක ඉදල තමයි අපි ජාත්‍යන්තර කම්කරු දිනය සමරන්නෙ. මේ රටට ඩොලර් ගේන්න කිසිම විදියක් තිබ්බ නැති මොහොතක, මේ රටට ඩොලර් නිෂ්පාදනය කරන ආර්ථිකයක් සකස් නොකර, කාන්තාවන් වහලුන් බවට පත් කරලා කාන්තාවන්ගේ ශ්‍රමය තව සූරාකාලා කාන්තාවන්ව බලා ගන්නෙ මේ විදියටයි. මේ අභියෝගාත්මක, තීරණාත්මක මොහොතෙ කාන්තාවන් එකාරශි වීම තමයි වැදගත් වන්නේ!"

මෙම වැඩකරන කාන්තා මැයි දින සැමරුමෙන් පසුව, කොළඹ 2 ස්ටැන්ලි ජැන්ස් පිටියේ පැවති එක්වෙමු ඒකාබද්ධ වෘත්තීය සමිති සංවිධානයේ මැයි දින රැලියට WLBC එක් විය.






# සම්මුතීන් ඇත, අයිතීන් නැත!

## කාන්තා නායකත්ව කේවල් කිරීමේ කමිටුව විසින් සංවිධානය කිරීමක්... මැයි දින ප්‍රකාශය

කාන්තා නායකත්වයෙන් යුත් කේවල් කිරීමේ කමිටුව (WLBC) යනු කාන්තාවන්ගේ සාමූහික කේවල් කිරීමේ බලය ශක්තිමත් කිරීම අරමුණු කරගත් කාන්තා නායකත්වයෙන් යුත් වෘත්තීය සමිතිවල සන්ධානයකි. කම්කරු ප්‍රතිපත්ති සාකච්ඡා කෙරෙන ජාතික කම්කරු උපදේශක සභාව තුළ කාන්තා නියෝජන නැත. ඇඟළුම් සේවිකාවන්ගේ වැටුප් මණ්ඩලවල කාන්තා නියෝජනයන් නොවේ. වෘත්තීය සමිති නායකත්වය දරන්නේ පිරිමින්ය. සේවා යෝජකයන්ගේ සංගම් ද එසේමය. ව්‍යවස්ථාදායකයේ ආධිපත්‍යය දරන්නේ පිරිමින්ය. පැහැදිලිවම, පිරිමින් කාන්තාවන් වෙනුවෙන් තීරණය කරයි. WLBC පිහිටුවන්නේ ජාතික මට්ටමේ අර්ථවත් සාමූහික කේවල් කිරීමේ ක්‍රියාවලීන්හි කාන්තාවන් සෘජුවම සම්බන්ධ කර ගැනීමටයි. තවද, ඇඟළුම් කර්මාන්ත අංශය Global Value Chainsys කොටසක් වන බැවින්, කාන්තා ශ්‍රමිකයින්ට ජාත්‍යන්තර සන්නාම සමඟ කේවල් කිරීමටත් සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානය, ජාත්‍යන්තර මූල්‍ය ආයතන සහ අනෙකුත් ජාත්‍යන්තර ආයතන සමඟ සම්බන්ධ වීමටත් බලය ලබා ගැනිමේ අරමුණින් WLBC පිහිටුවා ඇත.

WLBC සාමාජිකයින් වන්නේ නිමි භාණ්ඩ ඇඟළුම් හා රෙදිපිළි සේවක සංගමය, වාණිජ හා කාර්මික සේවක සංගමය, ඩාබිඳු සාමූහික සංගමය, RED සංගමය සහ Standup Movement Lankahs. WLBCහි සාමාජික සංවිධාන නිදහස් වෙළඳ කලාප සහ ඇඟළුම් කම්හල්වල වැඩ කිරීමේ දිගු ඉතිහාසයක් ඇත. ඒකාබද්ධ ව්‍යාපාරයක් ලෙස ඉදිරියට ගමන් කිරීමට තීරණය පැන නගින්නේ විසිරුණු ක්‍රියාවන් අපගේ කේවල් කිරීමේ ශක්තිය හීන කරන බව වටහා ගැනීමෙන් වන අතර සාමූහිකව කේවල් කිරීමට එක්වී කාන්තා ප්‍රමුඛ වෘත්තීය සමිති ලෙස අපගේ ස්ථාවරය ශක්තිමත් කිරීමයි.

ව්‍යවස්ථානුකූලව සහතික කර ඇති සංවිධානය වීමේ නිදහස සෘජුවම උල්ලංඝනය කරමින් වෘත්තීය සමිතිගත සේවකයින්ට හිරිහැර කිරීම, වෙනස් කොට සැලකීම සහ සේවයෙන් පහ කිරීම හරහා වෘත්තීය සමිති කඩාකප්පල් කිරීම ක්‍රමක්‍රමයෙන් දරුණු වෙමින් පවතී. වෘත්තීය සමිති අයිතිවාසිකම් ආරක්ෂා කරන නීති තිබියදීත්, මෙම නීති ක්‍රියාත්මක කිරීමට රජයේ ක්‍රියාමාර්ගවල අඩුවක් තිබේ. ඒ වෙනුවට මාර්ගගත ආරක්ෂණ පනත, ත්‍රස්තවාදය වැළැක්වීමේ

4 වන පිටුවට...



3 පිටුවෙන්... **සම්මුතීන් ඇත**

පනත යනාදිය, සහ යෝජිත කම්කරු නීති හරහා ද අපි රාජ්‍යයෙන්ම මර්දනය අත්විඳිමින්නෙමු.

ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසාව සහ ප්‍රචණ්ඩත්වය ඇඟළුම් කර්මාන්තය තුළ සහ ඒ අවට කාන්තාවන් සහ LGBTQ+ පුද්ගලයින් සඳහා බහුලව පවතින ගැටළු වේ. මෙම ප්‍රචණ්ඩත්වය සේවා ස්ථානයෙන් ඔබ්බට විහිදෙන අතර, රැකියාවට යන මග සහ බෝඩිම් නිවාස තුළත් අත්විඳිති.


නිවසේ වැටුප් නොලබන සුරැකුම් වැඩ කාන්තාවන්ට අසමානුපාතික ලෙස බර පටවන අතර, ඔවුන් අස්ථිර හා අවිධිමත් රැකියාවකට තල්ලු කරයි. නම්‍යශීලී වැඩ ප්‍රවර්ධනය කරන යෝජිත කම්කරු නීති අරමුණ වන්නේ කාන්තාවන්ගේ කාලය හා ශ්‍රමය තවදුරටත් සූරාකෑම මිස කාන්තාවන්ගේ බර අඩු කිරීම නොවේ.

මෙම මැයි දිනයේදී, ස්ත්‍රී පුරුෂ භාවය, ජාතිය සහ කුලය යනාදී සකලවිධ අනන්‍යතාවන් හේතුවෙන් අප අතර පවතින අසමානතා අනුදැක ඊට එරෙහිව සටන් කිරීමට අපි එක් වෙමු. වැඩ කරන කාන්තාවන් අත්හැර දමා ඇති ගෝලීය පාලනාධිකාරියටත්, නව ලිබරල් රාජ්‍යයටත් අරගල කිරීමටත් අදිටන් කරගනිමින් අපි පහත ලබා දෙන ලෙස බල කර සිටිමු.

1. **පැය 8 වැඩ දිනයට ජීවත් වීමට සරිලන වැටුපක් ලබා ගැනීමට;**
2. **සූරාකෑමට සහ වහල් සේවයට ඉඩ සලසන කම්කරු නීති හකුලා දැමීමට;**
3. **ඇඟළුම් සේවකයින්ගේ ශ්‍රමය සූරාකෑම සම්බන්ධයෙන් ජාත්‍යන්තර සන්නාම වගකීම භාර ගැනීමට;**
4. **කාන්තාවන්ගේ සංවිධානය වීමේ නිදහස, භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස සහ සාමූහික කේවල් කිරීමේ නිදහස ආරක්ෂා කිරීමට;**
5. **රැකියා ස්ථානයේ සහ ඉන් පිටත ලිංගික හිංසනයට හා ප්‍රචණ්ඩත්වයට නතර කිරීමට;**
6. **කර්මාන්තශාලා සහ සේවා ස්ථානවල දිවා සුරැකුම් පහසුකම්, දීර්ඝ කාලීන වැටුප් සහිත මාතෘ නිවාඩු සහ පීතෘ නිවාඩු වැනි කාන්තාවන් සඳහා ආධාරක ව්‍යුහයන් ලබා ගැනීමට;**
7. **පැය 24 පුරා ක්‍රියාත්මක වන කාන්තා පොලිස් කාර්යංශය ස්ථාපිත කිරීම, කාන්තා සේවිකාවන් සඳහා පවුල් සෞඛ්‍ය සේවය ලබා ගැනීම, රජය විසින් පවත්වාගෙන යනු ලබන ආරක්ෂිත නිවාස සහ වෛද්‍ය සායන හරහා කාන්තාවන්ට සහ LGBTQ+ පුද්ගලයින්ට වඩා හොඳ ආරක්ෂාවක් ලබා ගැනීමට;**
8. **සනීපාරක්ෂකවලට ගහන බදු අහෝසි කර සහනාධායී මිලට සනීපාරක්ෂක තුවා ලබා ගැනීමට;**
9. **ජනවරමක් නොලත් ආණ්ඩුවක් පිටුපස සැඟවී IMF කප්පාදු වැඩපිළිවෙල, වැට් බදු සහ විදුලි/ගෑස් මිල බදු ඉහළ නැංවීම සහ රාජ්‍ය ආයතන විකිණීම වහාම නතර කිරීමට;**

8 වන පිටුවට...

# පාස්කු සැමරුම




2019 වසරෙදී පාස්කු ඉරු දින සැමරුම් දිනය වූ අප්‍රේල් මස 21 වන දින මීගමුව, මඩකලපුව සහ කොළඹ පිහිටි පල්ලි තුනක් සහ කොළඹ පිහිටි සුඛෝපභෝගී හෝටල් තුනක් විදේශීය ත්‍රස්තවාදී සංවිධානයකට පක්ෂපාතී බව ප්‍රකාශ කළ දේශීය ත්‍රස්තවාදී කණ්ඩායමක් විසින් එල්ල කරන ලද සැලසුම් සහගත මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර මාලාවකට ලක් විය. මෙම ඛේදජනක සිදු වීම හේතුවෙන් විදේශීය ජාතිකයන් ද ඇතුළු සිවිල් වැසියන් 250කට අධික පිරිසක් මිය ගිය අතර, 500කට අධික පිරිසක් තුවාල ලබා ඇතැයි ඇස්තමේන්තු කර ඇත. මෙම ජන සංහාරයට අද වන විට වසර 05ක් ගතව ඇති නමුත් මෙයින් වින්දිතයින් බවට පත් වූ කිසිදු පුද්ගලයෙකුට නිතීමය වශයෙන් හෝ වෙනත් කිසිදු සහනයක් මෙතෙක් ලැබී නොමැත. මේ වෙනුවෙන් සිහිපත් කිරීමක් මීගමුව පුරවැසි එකතුව විසින් පසුගිය අප්‍රේල් 21 වන දින මීගමුවේ කටුව පිටිය මංසන්දියේ දී පවත් වන ලදී.

# පවුල් සෞඛ්‍ය සේවා නිළධාරීන් සඳහා සංවේදී කිරීමේ වැඩමුළු

ඩාබිඳු සාමූහිකය විසින් පවුල් සෞඛ්‍ය සේවා නිළධාරීන් 50දෙනෙකු සඳහා සංවේදී කිරීමේ වැඩමුළු දෙකක් එක්ව පවත්වන ලදී. 2024 අප්‍රේල් මස 26 දින සීදූව සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය සමඟ මෙන්ම 2024 මැයි මස 12 වන දින කිළිනොච්චි සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාල සමඟ පවත්වන ලද සංවේදි කිරීමේ වැඩසටහනේ අරමුණු ලෙස ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ කලාප සහ අනෙකුත් නිෂ්පාදන ප්‍රදේශවල (කිලිනොච්චි සහ වවුනියාව) කාන්තා සේවිකාවන් සහ LGBTIQA+ ප්‍රජාව මුහුණ දෙන ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය අයිතීන් උල්ලංඝනය කිරීම් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩ ගැටළු පිළිබඳව පවුල් සෞඛ්‍ය සේවිකාවන් දැනුවත් කිරීම; ආන්තික හා අවදානමට ලක්විය හැකි අයට එරෙහිව ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය අයිතීන් උල්ලංඝනය කිරීම්වලට ක්‍රියාකාරීව ප්‍රතිචාර දැක්වීමට පවුල් සෞඛ්‍ය සේවා නිළධාරීන් දිරිමත් කිරීම; සහ ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ කලාප සහ අනෙකුත් නිෂ්පාදන ප්‍රදේශවල කාන්තා සේවිකාවන් සහ LGBTIQA+ ප්‍රජාවන්ට විස්තීර්ණ සේවාවන් සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීමේ අරමුණින් සේවා සපයන්නන් සහ කාන්තා සේවිකාවන් සහ LGBTIQA+ ප්‍රජාව අතර සම්බන්ධතා ගොඩ නැගීම දැක්විය හැක. ඩාබිඳු සාමූහිකයේ විධායක අධ්‍යක්ෂිකා චමිලා තුෂාරී මහත්මිය විසින් ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ කලාප සහ අනෙකුත් නිෂ්පාදන ප්‍රදේශවල කාන්තා සේවිකාවන් සහ LGBTIQA+ ප්‍රජාවගේ ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය අයිතීන් ආරක්ෂා කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීම පිළිබඳ සැසිය පැවැත්වූ අතර සේවා සපයන්නන් සහ කාන්තා සේවිකාවන් සහ LGBTIQA+ ප්‍රජාව අතර සම්බන්ධතා ගොඩ නගාගත හැකි ආකාරය පිළිබඳ සාකච්ඡාවක් පැවැත්විණි. සෞඛ්‍ය සේවාව ප්‍රජාව වෙත ලබා දීමේදී පවතින හිඩැස් සහ ඒවාට විසඳුම් සෙවීම මෙම වැඩසටහනෙහි සුවිශේෂිතාවයකි.

# ඇඟළුම් කම්හල් සේවක කාන්තාවන්ගේ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය අයිතීන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන



ඇඟළුම් කම්හල් සේවක කාන්තාවන්ගේ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය අයිතීන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් මැයි මස 12 වන දා කටුනායක Full Moon හෝටල් පරිශ්‍රයේ දී පැවැත්විණි. ඩාබිඳු සාමූහිකයේ පූර්ණ අනුග්‍රහය යටතේ සීදූව මහජන සෞඛ්‍ය නිලධාරී කාර්යාලයේ ප්‍රධාන වෛද්‍ය රවී සිල්වා මහතාගේ සහභාගිත්වයෙන් පැවැත්වූ මෙම වැඩසටහනට වෙළෙඳ කලාපයේ සේවය කරන කාන්තාවන් විසි එක් දෙනෙකු සහභාගි වූ අතර මහජන සෞඛ්‍යය කාර්යාලය සහ ඇඟළුම් ක්ෂේත්‍රයේ නියුතු පිරිස අතර අන්තර් සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම මෙහි මූලික අරමුණයි.

එහි දී ඔවුන්ගේ සේවා ස්ථානයේ සහ වෘත්තීමය ගැටළු පිළිබඳවත් නේවාසිකාගාරවල පවතින ගැටළු පිළිබඳවත් කණ්ඩායම් ක්‍රියාකාරකම් හරහා සාකච්ඡා කරන්නට විය.

සීදූව මහජන සෞඛ්‍ය නිලධාරි කාර්යාලයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී රවී සිල්වා මහතා විසින් ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ කාන්තාවන් සතු දැනුම නිවැරදි කිරීම මූලික අරමුණු කර ගනිමින් අර්ථවහරණය, සනීපාරක්ෂාව, පෝෂණය, බෝවන රෝග, බෝනොවන රෝග, පවුල් සැලසුම්කරණය, කාන්තා හිංසනය පිළිබඳව කරුණු පැහැදිලි කර දීම සිදු කරන්නට විය.

තවද ගබ්සාව සහ ප්‍රජනන පද්ධතිය ආශ්‍රිත රෝග, පිළිකා තත්ත්වයන්, ඒ ආශ්‍රිත ගැටළු සහ එම තත්ත්වයන් වල දී පිළිපැදිය යුතු කරුණු කාරණා පිළිබඳව ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳවත් වඩාත් හරවත් දේශනයක් වෛද්‍යතුමා විසින් සිදු කරන ලදී.

එසේම සීදූව මහජන සෞඛ්‍ය කාර්යාලය තුළින් ලබා දෙන සේවාවන් ලෙස විවාහ වීමට පෙර තරුණ තරුණියන්ට උපදේශන සායන, ගර්භණී කාන්තාවන්ගේ දරු ප්‍රසූතියෙන් පසුව පවත්වන ලද සායන, පවුල් සැලසුම්කරණය, මානසික සෞඛ්‍ය උපදේශන සායන, සුවනාරී සායන, දන්ත සායන යන සායන පවත් වන බවත් සහ එම සායන පවත් වන දින සහ වේලාවන් පිළිබඳවත් වෛද්‍ය තුමා විසින් පැමිණ සිටි පිරිස දැනුවත් කරන ලදී.

# උපදේශනය





මානසික සුවතාවය ඕනෑම කෙනෙකුගේ ජීවිතයේ යහපැවැත්මට පාදක වන්නා වූ මූලිකම සාධකයකි. විශේෂයෙන්ම විවිධ දුෂ්කරතා යටතේ ඇඟළුම් කර්මාන්තාලාවල සේවය කරන කාන්තාවන්ගේ මානසික සුවතාවය පිළිබඳව සංවේදීව මැදිහත්වීම සමාජ සේවා සංවිධානයක් ලෙස ඩාබිඳු අපගේ මූලික ඇගයුම්වලින් එකකි. තනි හා කණ්ඩායම් වශයෙන් මෙම උපදේශන වැඩසටහන් පවත්වන ලද අතර විසින් උපදේශනය මෙහෙය වන ලදී. 2024 මාර්තු මස 03 වන දින කිලිනොච්චි හා වවුනියා හි දී කණ්ඩායම් උපදේශන සැසි පවත්වන ලදී. උපදේශක ඇන්ටන් පුනිතන් හා උපදේශිකා ප්‍රියා යන අය මේ සඳහා සම්පත් දායකත්වය දක්වන ලදී.

# පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන



ඩාබිඳු සාමූහිකය විසින් ප්‍රථම වරට උතුරේ කම්කරු නායකයින් ඉලක්ක කර ගනිමින් පවත් වන ලද පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන මෙවරත් අප්‍රේල් මස 27, 28 වන දෙදින වවුනියාවේ පවත්වන ලදී. 2018 දී පවත් වන ලද වැඩසටහන් හි දිගුවක් ලෙස මෙම වැඩසටහන මෙම වසරේ දීත් අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබීය. කම්කරුවන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඔවුන් අතරින් නායකත්වය ගත හැකි අය තෝරා ගෙන කම්කරු ගැටළු වෙනුවෙන් පෙනී සිටීමට ඔවුන් අතරින්ම නායකයින් ගොඩ නැංවීම මෙහි අරමුණයි. මෙහි සම්පත් දායිකාව ලෙස නියන්තිනී ගදිරගාමර් යන අය සහභාගී වන ලදී. වැඩසටහන වවුනියාව ඔවියා හෝටල් පරිශ්‍රයේ දී දින එක හමාරක් සංවිධානාත්මකව පවත් වන ලදී.



# පොදු කුස්සිය

රටේ පවතින්නා වූ වත්මන් ආර්ථික අර්බුදය හමුවේ පෝෂ්‍යදායක ආහාර වේලක් සපයා ගැනීම බොහෝමයක් දෙනෙකුට ගැටළුවක් බවට පත්ව ඇත. ඇඟළුම් සේවිකාවන්ට ආයතන මඟින් ලබා දෙන්නා වූ ආහාර ද කිසිසේත්ම පෝෂ්‍යදායක අන්දමින් සකස් නොවේ. මෙසේ අඩු පෝෂණ තත්ත්ව යටතේ රැකියාවන්හි නිරත වන්නා වූ කාන්තාවන්ට සවියක් වීම පිණිස ඩාබිඳු සාමූහිකයේ අපි පොදු කුස්සිය වැඩ සටහන ආරම්භ කරන ලදී. මේ හරහා කම්කරු කාන්තාවන්ට ඔවුන්ගේම ශ්‍රම දායකත්වය ඇතිව වඩා සෞඛ්‍යාරක්ෂිතව හා පෝෂ්‍යදායක ලෙස සැකසූ ආහාර වේලක් භුක්ති විඳීමේ අවකාශය සැළසේ. මෙවර ඩාබිඳු පොදු කුස්සිය සුබසාදන වැඩසටහන් මාලාව මාර්තු 31 වන දින වවුනියාවේ දී සාර්ථකව ක්‍රියාත්මක කෙරිණි.



4 පිටුවෙන්... **සම්මුතීන් ඇත**



10. විදේශ ණය බර වැඩකරන ජනතාවට පැටවීම නවත්වා ජාත්‍යන්තර පෞද්ගලික බැඳුම්කර හිමියන්ගෙන් විශාල ණය කප්පාදුවක් ලබා ගැනීමට;
11. අර්ථ සාධක අරමුදලේ පොළී කප්පාදුව සහ බදු අයකිරීම නැවැත් වීමට;
12. අත්‍යාවශ්‍ය සහනාධාර සහ නිදහස් සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපන පද්ධතියේ සම්පත් වැඩි කර ගැනීමට;
13. වතු කම්කරුවන්ට ඉඩම්, නිවාස, අධ්‍යාපනය සහ සෞඛ්‍ය පහසුකම් දියුණු කර ගැනීමට;
14. කුඩා පරිමාණ ගොවීන්ගේ සහ ධීවරයන්ගේ ජීවනෝපාය ස්වෛරීභාවය ආරක්ෂා කර ගැනීමට;

අපි බල කර සිටිමු.

WLBC ලෙස අපි ජාත්‍යන්තර කම්කරු දිනය වැඩ කරන කාන්තාවන්ගේ මැයි දිනය ලෙස සැමරීමට තීරණය කරනු ලැබුවේ කාන්තා ශ්‍රමය විධිමත් සේවා ස්ථාන, කම්හල්, වතු, ගොවිබිම් සහ මුහුදු සීමාවන් ඉක්මවා යන බව නැවත අවධාරණය කිරීම සඳහාය. එය නිවෙස් තුළත් අවිධිමත් අංශය තුළත් වන පිළිනොගත්, අගය නොකළ සහ බොහෝ විට ආන්තිකණයට ලක් වූ ශ්‍රමය දක්වා විහිදේ. අපි ජාත්‍යන්තර කම්කරු දිනය සමරන විට, වැටුප් නොලබන සුරැකුම් වැඩවල නිරත වෙමින් රටේ ආර්ථිකය පවත්වාගෙන යාමට දායක වන කාන්තා ශ්‍රමයේ බහුවිධ ස්වභාවය අපි සමරන්නෙමු.

**වැඩ කරන කාන්තාවන්ට ජය!**



# රානා ප්ලාසා කඩාවැටීම පිළිබඳව සිහිපත් කිරීමයි

මීට වසර එකොළහකට පෙර බංග්ලාදේශයේ රානා ප්ලාසා ගොඩනැගිල්ල කඩා වැටීමෙන් පුද්ගලයන් 1,138 දෙනෙකු ජීවිතක්ෂයට පත්වූ බව අප සිහිපත් කරමු. මෙම ඛේදවාචකයෙන් දිවි අහිමි වූ ආදරණීයයන් සහ ඒ හරහා අගතියට පත් වූ සෑම සේවකයෙකු වෙනුවෙන්ම අප පෙනිය සිටිය යුතු වේ. කම්කරුවන්ගේ ජීවිත වෙළඳ භාණ්ඩයක් නොවන බවත් එය සුළු කොට ඉවත දැමිය හැකි දෙයක් ලෙස සැළකිය නොහැකි බවත් පැහැදිලි කිරීමට අපි ඇඟළුම් සේවක සංගම් සමඟ කරට කර සටන් වදිමු.

රානා ප්ලාසා කඩා වැටීමේ ඛේදවාචකය මිනිසා විසින් සාදන ලද සහ වළක්වා ගත හැකි ව්‍යසනයක් වන අතර, අනාරක්ෂිත කර්මාන්තශාලා පිළිබඳ ගැටළුව විසඳීමට සමාගම් අසමත් වීම හේතු කොට ගෙන මෙන්ම සමාගම් පාලන අධිකාරියේ නොසැළකිලිමත්කම සහ කෑදරකම නිසා ඇති වූ අතර කම්කරුවන් තවමත් අසරණ තත්ත්වයක හා හුදකලා තත්වයකට පත් කර ඇත. වැටුප් ගෙවීම පැහැර හැරීම සහ වෘත්තීය සමිති ක්‍රියාකාරකම් මර්දනය කිරීම පිළිබඳව කම්කරු නායකයින්ට ආවර්ජනය කරමු. 2013 සිට තුන්වන වරටත් කම්කරුවන් ඔවුන්ගේ අයිතීන් පිළිබඳ දැවැන්ත මර්දනයකට හා ආපදාවන්ට පත්ව ලක්ව ඇති අතර, බොහෝ පැතිවලින් කම්කරුවන් වසර එකොළහකට පෙර පැවති තත්ත්වයට වඩා කිසිදු ආකාරයක සාධනීය තත්ත්වයක් ළඟා කර ගෙන නැති බවත්, රානා ප්ලාසා කඩා වැටීමෙන් උගත් පාඩම් බොහොමයක් ඉක්මනින් අමතක වූ බවත් අපි සටහන් කරමු. මෙම මර්දනයට එරෙහිව සටන් කරන සියළුම කම්කරුවන් සහ ඔවුන්ගේ වෘත්තීය සමිති සමඟ අපි සහයෝගයෙන් සිටිමු. මෙම ක්‍රමයට පිටුපා මුදල් උපයන සියළුම පාර්ශ්වකරුවන් මෙම තත්ත්වය සඳහා වගකීම දරයි.

මෙම දිනයේදී අපි ඇඟළුම් සැපයුම් දාමයේ සියළුම කර්මාන්තශාලා සහ ඒ ආශ්‍රිත කර්මාන්ත සුරක්ෂිත කිරීම සඳහා අඛණ්ඩව සටන් කරන බවට ප්‍රතිඥා දෙමු, මෙම කර්මාන්තශාලාවල සියළුම සේවකයින්ට නීතියෙන් දක්වා ඇති හොඳින් ක්‍රියාත්මක වන රැකියා සහ අපදාවන්ට පත් වූවන්ට රක්ෂණ පද්ධතියකින් ආවරණය වන පරිදි සහ සියළුම කම්කරුවන්ට ජීවන වැටුපක් ලැබීමට සහ වෘත්තීය සමිති තුළ සංවිධානය වීමට හැකි වීම යනාදී වූ සියළු ආකාරයේ කම්කරු අයිතිවාසිකම් වෙනුවෙන් අප පෙනී සිටිමු.

# සිතුවිල්ල

මේ මැයි ගහ යට දවසක් දා වැස්සට අපි උන්නා කියමින් යසෝමා කාමරයට ගොඩ වැදුණාය. ජොන්නා පැන්නා වගේ මේ මැයි ගහ යට මොන මඟුලක් කරනව ද අද මැයි පළවෙනිදා අපේ දිනය මතක නැද්ද? යමන් ඇඳුමක් දාගෙන. බත් පාර්සලයක් අතට කීයක් හරි ලැබෙයි. කාමරයට වෙලා හිටියොත් හුප්පෙ තමයි. ගියා නම් ඇගේ හිරි යන්න පපරෙටවත් නටන්න තිබුණා. අනේ බොලව් මැයි දිනය කියන්නේ ඒක ද, මැයි පළවෙනිදා කියන්නේ කියන්නේ කම්කරු දිනයට. පැය අටේ සේවය ඉල්ලා කරපු වැඩ වර්ජනයේ දී පොලිස් වෙඩි පහරට ලක් වුණු කම්කරුවන් සිහි කිරීමයි. දෑකැත්තයි මිටියයි සහිත ධජයක් අත ඇතිව යන පෙළපාලියක් නැතිව නැව ගිළුනත් බෑන් චූන් කිව්වලු. අපේ තාත්තා නම් කියනවා එයාලගෙ කාලේ පෙළපාලි ගියේ සඟ වෙද ගුරු ගොවි කම්කරුවන් සිය අයිතිවාසිකම් වෙනුවෙන්. ඒකට දැන් කාලේ එකිනෙකාට මඩ ගසා ගනිමින් විවේචනය කරමින් තම බලය පෙන්වමින් කෑ මොර දෙනවා මිස ගිලිහී යන කම්කරු අයිතිවාසිකම් රැක දීමට තැත් දැරීමත් දක්නට නැත.

ලක්ෂ ගණන් ශ්‍රම බලකායක් පෞද්ගලික අංශයේ සේවය කරති. ශ්‍රම සූරා කෑමට ලක් වී සිටින තරුණ පීඩිත පිරිස් වෙත වගකිව යුත්තන්ගේ අවධානය යොමු වී නොමැත. එම නිසා දිනෙන් දින පවතින වැඩ වර්ජන නිමක් නැත. දිනෙන් දින උද්ගත වන ආර්ථික අර්බුදය හමුවේ තරුණ පිරිස් රට හැර යාමේ ප්‍රවණතාවයක් දක්නට ඇත. අපගේ රැකියාවල ද ස්ථිරත්වයක් නොමැත. කොයි මොහොතේ කම්හල් වැසී යාවි ද යන්න ගැටළුව කි. දැනටමත් වෙළඳ කලාපයේ බොහෝ දෙනෙක් රට හැර ගොස් ඇත. අප ඉතින් කුමක් කරන්න ද? වැහැරුණු සිරුරු සමඟ ගමට යනු මිසක.

සමන්තා

# සිනහවේ කඳුළු කතාව

නිදහස ලබා ගැනීමෙන් පසු ඉතිහාසයේ දරුණුතම ආර්ථික අර්බුදයට ලංකාව මේ වන විට මුහුණ දී තිබේ. ඉහළ උද්ධමන අනුපාත, මුදල් අවප්‍රමාණය, විරැකියාව සහ ණය බර වැනි සාධක රට පුරා සිටින පවුල් මුහුණ දෙන අභියෝගවලට දායක වේ. ආන්තික ප්‍රජාවන් මත අමතර බර පටවමින්, දරිද්‍රතාවයෙන් බැටකමින් සමාජ අසමානතා වැඩි කරයි.

ඇත්තෙන්ම මෙකී ආර්ථික අර්බුදය නිසාවෙන් පීඩාවට පත් වන්නේ කවුද? වෙන කවරෙකුත් නොවේ අපේම පීඩිත පන්තියේ දෛනික වැටුප් ලබන්නන්, ක්ෂුද්‍ර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, නාගරික කම්කරු දුප්පතුන් ඇතුළු යැපුම් වේතන මත ජීවත් වන අපගේම සිනහවේ කඳුළු කතාව යි. එකී තත්ත්වය නිසාවෙන් කලක් විචිත්‍රවත් වර්ණ සහ උණුසුම් සිනහවෙන් පිරී තිබූ ශ්‍රී ලංකාවේ කාර්යබහුල වීදිවල, දැන් ආර්ථික අවිනිශ්චිතතාවයේ සෙවනැල්ලක් වැටී ඇත්තේ සිනහවක සේයාවක්වත් නොපෙනෙනා සේය. පවතින ආර්ථික අර්බුදයක කටුක යථාර්ථයෙන් යටපත් වී, පවුල තුළ සතුට සිනහව පැල දොරෙන් පැනයන්නේ පැදුරටත් නොකියාමය.

ලාංකීය සමාජය තුළ පවුල ආදරය, රැකවරණය, සහයෝගය, ඔරොත්තු දීම වැනිම වූ සාධකයන්ගෙන් ගහණ වී සැදුම් ලද්දකි. නමුදු වත්මන් රටේ ආර්ථික තත්ත්වය හමුවේ එය දෙදරා ගොස් අඩුවන ආදායම්, ඉහළ යන උද්ධමනය සමඟ පවුල් පොරබදන්නේ අවිනිශ්චිත අනාගතය බලාපොරොත්තුවකිනි.

සැකසුම : රශ්මි වීරක්කුට්ටි

# සෙනෙහස පුදකළ ආදර අම්මේ...

සෙනෙහස පුදකළ ආදර අම්මේ
ඔබටයි මේ අමතන්නේ
ඇස් දෙක වාගේ හැදූ ඔබේ දියණිය
මැෂිමට අද දියවෙන්නේ

"ටාගට්" දෙන්නට බැරි වී අම්මේ
කුසගින්නේ රෙදි මහලා
ඇයි අම්මේ අද ඔබේ සුදු දියණිය
රූකඩයක් මෙන් ඇදිලා

දුප්පත් වීලා ඉපදුන හින්දනේ
ඉගෙන ගන්න බැරි වූයේ
අම්මට තාත්තට කරදර හින්දනේ
වෙළඳ කලාපෙට ආවේ

මැෂිමට තද වී අත්දෙක අම්මේ
කරගැට මතු වී ඇත්තේ
මොනවා කරන්නද දුක හින්දානේ
මෙලෙසින් අප බිලි වන්නේ

වැඩ කරනා විට මැරුනොත් අම්මේ
මා මේ වැඩ පල ඇතුලේ
හඬනු එපා ඔබ මා ගැන සිතමින්
මතු ඔබේ දියණිය වන්නේ...

නිල්මිණි අයිරාංගනි



# ප්‍රහේලිකා අංක - 46

| | | | | |
|---|---|---|---|---|
| 1 ක | | 2 | | 3 |
| | ■ | | ■ | න් |
| 4 ක | | ම | 5 | ■ |
| | ■ | 6 | | 7 |
| 8 | | ■ | ■ | |

## හරහට

1. සුළු අපනායන බෝගයකි.
4. ගැමියන්ගේ එදිනෙදා අවශ්‍යතා සඳහා ආයුධ තනා ගන්නා ස්ථානයකි.
6. නිවිතිවල අඩංගු පෝෂ්‍යදායි පදාර්ථය.
8. අවාසි යන්නෙහි විරුද්ධාර්ථය.

## පහළට

1. මැයි පළමුවනදා මොවුන්ගේ දිනයකි.
2. වඩු කාර්මික ආයුද කට්ටලයට අයත් වුවකි.
3. ලෝහ වර්ගයකි.
5. ලකුණ යන අර්ථය දේ.
7. බංගලාදේශයේ අගනුවරකි.

මෙම ප්‍රහේලිකාව නිවැරදිව පුරවා
මෙම ලිපිනයට එවා තෑගි දිනන්න.
ඩාබිඳු සාමුහිකය
221, වෙළබඩ පාර, කටුනායක.



# අවවාදයයි!!!

## ඔබට ආයතනයෙන් ලබා දෙන ඖෂධ පිළිබඳ ඔබ දැනුවත් ද?

නිදහස් වෙළඳ කලාපවල කාන්තාවන් වෙනුවෙන් ලබා දෙන්නා වූ විවිධාකාරයේ ඖෂධ පිළිබඳව අප දැනුවත් විය යුතු වෙමු. ආයතන මගින් කම්කරුවන් වෙනුවෙන් නිකුත් කරන්නා වූ මෙම ඖෂධ සම්බන්ධයෙන් නිසි නියාමනයක් නොමැති වීම බරලතල ගැටළුවකි. කටුනායක හා බියගම ඇඟළුම් කලාප හා ඉන් පරිබාහිරව ක්‍රියාත්මක වන උතුරේ කර්මාන්තශාලා ආශ්‍රිතව ද මෙම තත්ත්වට බහුලව දැකිය හැකි අතර කම්කරු කාන්තාවන් විසින් මුහුණ දෙන්නා වූ මානසික අපහසුතාවයන්හි දී බොහෝ දෙනෙක්ට සුළු තත්ත්වයක් ඇති වූව ද ඒ වෙනුවෙන් මානසික වෛද්‍යවරුන්ගේ නිසි නියාමනයන් ගෙන් තොරව ඖෂධ ලබා දෙනු ලබයි. මෙම ඖෂධ භාවිතා කිරීම නිසා ඔවුන් වෙනත් ශාරීරික හා මානසික අවපීඩනයන්ට මුහුණ දෙන බව පවසයි. මෙම කම්කරු කාන්තාවන්ට ලබා දෙන ඖෂධ පිළිබඳව නිසි අවබෝධයක් නොමැති අතරම ඔවුන් ආයතනය මගින් ලබා දෙන නිසා ඒ පිළිබඳව විශ්වාසය තබා එම ඖෂධ භාවිතා කරනු ලබයි. වෙළඳ කලාප වල රැකියාවන්හි නිරත වන බොහෝමයක් කාන්තාවන් යොවුන් වියේ පසුවන අය වේ. ඔසප් වීම පාලනයට ලබා දෙන විවිධ ඖෂධ පිළිබඳව උතුරේත් දකුණේත් වෙළඳ කලාපයන් හි බොහෝ කාන්තාවන් විසින් සඳහන් කරනු ලබයි. මෙසේ ඔසප් චක්‍රයේ ක්‍රියාත්මක වීම පාලනයට ඖෂධ ලබා දී සෘජුවම මෙම කාන්තාවන්ගේ ප්‍රජනන සෞඛ්‍යයට බලපානු ලබයි. මෙසේ නිසි වෛද්‍යමය නියාමනයක් නොමැතිව ආයතනයන් විසින් ඖෂධ නිකුත් කිරීම පිළිබඳව අදාළ බලධාරීන් විසින් නිසි පියවර ගත යුතු තත්ත්වයක් බවට පත්ව ඇත.

අංක: 221, වෙළබඩ පාර, කටුනායක හි පදිංචි එච්. අයි. සමන්මලී වන මා විසින් මීගමුව රන්වැකි මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදි.